ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

**නිකුත් කළේ** ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

**දිනය** 2020 ජූලි මස 13 දින

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 මැයි

## සමස්ත නිරීක්ෂණ

| | 2020 මැයි | 2020 ජන. - මැයි |
|---|---|---|
| වෙළඳ හිඟය | එ.ජ.ඩො. මිලියන 407<br>2019 මැයි<br>එ.ජ.ඩො. මිලියන 823 | එ.ජ.ඩො. මිලියන 3,100<br>2019 ජන. - මැයි<br>එ.ජ.ඩො. මිලියන 3,281 |
| වෙළඳ භාණ්ඩ අපනයන | එ.ජ.ඩො. මිලියන 587<br>2019 මැයි<br>එ.ජ.ඩො. මිලියන 961<br>-39.0% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 3,519<br>2019 ජන. - මැයි<br>එ.ජ.ඩො. මිලියන 4,915<br>-28.4% වාර්ෂික ලක්ෂ්‍යමය |
| වෙළඳ භාණ්ඩ ආනයන | එ.ජ.ඩො. මිලියන 994<br>2019 මැයි<br>එ.ජ.ඩො. මිලියන 1,784<br>-44.3% වාර්ෂික ලක්ෂ්‍යමය | එ.ජ.ඩො. මිලියන 6,619<br>2019 ජන. - මැයි<br>එ.ජ.ඩො. මිලියන 8,196<br>-19.2% වාර්ෂික ලක්ෂ්‍යමය |

**සංචාරක ඉපැයීම්**
2020 මැයි: ශුන්‍යයි
(-100% වාර්ෂික ලක්ෂ්‍යමය)
2020 ජන. - මැයි: එ.ජ.ඩො. මිලියන 956
(-46.3% වාර්ෂික ලක්ෂ්‍යමය)

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**
2020 මැයි: එ.ජ.ඩො. මිලියන 432
(-23.2% වාර්ෂික ලක්ෂ්‍යමය)
2020 ජන. - මැයි: එ.ජ.ඩො. මිලියන 2,407
(-11.9% වාර්ෂික ලක්ෂ්‍යමය)

| කොළඹ කොටස් වෙළඳපොළ (ද්විතීයික වෙළඳපොළ-ශුද්ධ) | රාජ්‍ය සුරැකුම්පත් (ශුද්ධ) | දළ නිල සංචිත | විනිමය අනුපාතිකය (එ.ජ ඩොලරයට රුපියල්) |
|---|---|---|---|
| 2020 මැයි: මිලියන -36<br>2020 ජන. - මැයි: එ.ජ.ඩො. මිලියන -65 | 2020 මැයි: එ.ජ.ඩො. මිලියන -3<br>2020 ජන. - මැයි: එ.ජ.ඩො. මිලියන -454 | 2020 මැයි අග - එ.ජ.ඩො. බිලියන 6.5<br>(ආනයනික මාස 4.2) | 2019 දෙසැ. අග - 181.6340<br>2020 මැයි අග - 186.2865 |













ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

## සමස්ත නිරීක්ෂණ

2020 වසරේ මැයි මස දෙවන සතියේ දී සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම් බොහොමයක් ඉවත් කිරීමත් සමඟ විදේශීය අංශය ස්ථාවර වීමේ සලකුණු පෙන්නුම් කළේය. මැයි මාසයේ දී භාණ්ඩ ආනයන සැලකිය යුතු ලෙස අඩු වීමත් සමඟ, අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා පනවන ලද සීමා කිරීම්වල බලපෑම නිරීක්ෂණය කළ හැකි විය. මේ අතර, අප්‍රේල් මාසයේදී සැලකිය යුතු ලෙස පහත වැටුණු භාණ්ඩ අපනයන, මැයි මාසය තුළ දී අපේක්ෂිත මට්ටම ඉක්මවා නැවත යථා තත්ත්වයට පත් විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2019 වසරේ මැයි මාසයට සාපේක්ෂව 2020 වසරේ මැයි මාසයේදී සැලකිය යුතු ලෙස අඩු වූ නමුත් 2020 අප්‍රේල් මාසයේ වාර්තා වූ ඉතා අඩු මට්ටමට සාපේක්ෂව සැලකිය යුතු වැඩි වීමක් වාර්තා කළේය. මූල්‍ය ප්‍රවාහ සැලකීමේදී, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය මැයි මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් මත වූ ආයෝජනවල සුළු ගෙවීම් වාර්තා වීමත් සමඟ තවදුරටත් සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතුණි. 2020 වසරේ මැයි මස මැද භාගයේදී කොළඹ කොටස් වෙළඳපොලේ ගනුදෙනු නැවත ආරම්භ කිරීමත් සමඟ යම් විදේශීය ආයෝජන ගෙවීම් ප්‍රමාණයක් වාර්තා විය. ප්‍රධාන වශයෙන් වෙළඳ හිඟය අඩු වීම හේතුවෙන්, ශ්‍රී ලංකා රුපියල මැයි මාසය තුළ සියයට 3.5ක අතිප්‍රමාණයක් වාර්තා කරමින් ස්ථාවර විය.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 මැයි එ.ජ.ඩො. මිලියන | 2020 මැයි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- මැයි එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- මැයි එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 961 | 587 | -39.0 | 4,915 | 3,519 | -28.4 |
| ආනයන | 1,784 | 994 | -44.3 | 8,196 | 6,619 | -19.2 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -823 | -407 | | -3,281 | -3,100 | |
| සංචාරක ඉපැයීම් | 71 (ආ) | - | -100.0 | 1,782 (ආ) | 956 (ඇ) | -46.3 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 562 | 432 | -23.2 | 2,733 | 2,407 | -11.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 4 | -36 | | -20 | -64 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 141 | 111 | | 3,380 | 1,072 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 60 | 2 | | 327 | 86 | |
| දිගුකාලීන ණය | 81 | 109 | | 653 | 985 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 2,400 | - | |
| විදේශ සෘජු ආයෝජන (ඉ) | | | | 255 | 192 | |
| සමස්ත ශේෂය | | | | -127 | -797 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- අපනයනවල පහත වැටීම අභිබවා ආනයන පහත වැටීම හේතුවෙන් වෙළඳ හිඟය 2019 වසරේ මැයි මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 823 සිට 2020 වසරේ මැයි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 407ක් දක්වා එ.ජ.ඩොලර් මිලියන 416කින් අඩු විය. එසේම, සමුච්චිත පදනම මත වෙළඳ හිඟය 2019 වසරේ පළමු මාස පහ තුළ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 3,281 සිට 2020 වසරේ පළමු මාස පහ තුළ දී එ.ජ.ඩොලර් මිලියන 3,100ක් දක්වා එ.ජ.ඩොලර් මිලියන 180කින් අඩු විය. 2020 වසරේ පළමු මාස පහ තුළදී වෙළඳ හිඟය අඩු වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 01 මගින් දැක්වේ.
- මේ අතර, අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන වෙළඳ මිල අනුපාතය 2019 වසරේ මැයි මාසයට සාපේක්ෂව 2020 වසරේ මැයි මාසයේදී සියයට 20.6 කින් වර්ධනය වූ අතර, මේ සඳහා අපනයන මිල ගණන් ඉහළ යෑම හා ආනයන මිල ගණන් පහත වැටීම හේතු විය.

**රූප සටහන 1: වෙළඳ හිඟය අඩුවීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2020 ජනවාරි - මැයි (එ.ජ. ඩොලර් මිලියන)**




**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 – 2020)




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 – 2020)




**මූලය** : ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරීත්වය

- සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීම ක්‍රමයෙන් ලිහිල් කිරීම සහ දේශීය හා ගෝලීය යන දෙඅංශයේ ම සැපයුම් හා ඉල්ලුම් දාම වෙත තිබූ බාධා තරමක් දුරට අඩු වීමත් සමඟ අපනයන අංශයේ කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමට පටන් ගැනුණි. 2020 වසරේ මැයි මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2020 වසරේ අප්‍රේල් මාසයේදී වාර්තා වූ අගය මෙන් දෙගුණයකටත් වඩා ඉහළ අගයක් වාර්තා කරමින් ඒ.ජ.ඩොලර් මිලියන 587ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, 2019 වසරේ මැයි මාසයට සාපේක්ෂව වෙළඳ භාණ්ඩ අපනයන ආදායම සියයට 39.0කින් පහත වැටුණි.
- කාර්මික අපනයන ආදායම වැඩි වේගයකින් පහත වැටීමත්, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන ආදායම අඩු වේගයකින් පහත වැටීමත් සමඟ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ප්‍රධාන අපනයන අංශ තුනෙහිම ආදායම පහත වැටුණි. රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ආහාර, පානවර්ග හා දුම්කොළ වැනි ප්‍රධාන අපනයන නිෂ්පාදිත, 2020 වසරේ මැයි මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහත වැටුණු නමුත්, 2019 වසරේ දී වාර්තා වූ සාමාන්‍ය මාසික අගයෙන් අඩක් පමණ දක්වා යථා තත්ත්වයට පත්විය. කෙසේ වුවද, මුහුණු ආවරණ, ආරක්ෂිත ඇඳුම් කට්ටල, ශල්‍ය අත්වැසුම් වැනි පෞද්ගලික සනීපාරක්ෂක උපකරණ සඳහා වන ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය (රෙදිපිළි හා ඇඟලුම් යටතේ වර්ගකර ඇති) සහ ශල්‍ය හා වෙනත් අත්වැසුම් (රබර් නිෂ්පාදිත යටතේ වර්ගකර ඇති) අපනයන ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මේ අතර, ජාත්‍යන්තර වෙළඳපොළෙහි තේ සඳහා ඉහළ සාමාන්‍ය මිල ගණන් වාර්තා වුවද, දේශීය තේ නිෂ්පාදනය අඩුවීම නිසා ප්‍රධාන වශයෙන් තේ අපනයන පරිමාව අඩුවීම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන

ඉහළ ගිය ද, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයන පරිමාව අඩුවීම හේතුවෙන් පොල් අපනයන ආදායම පහත වැටුණි. ප්‍රධාන වශයෙන් පුවක් අපනයන ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ මැයි මාසයේදී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත  අපනයන ඉහළ ගියේය.

- 2020 වසරේ මැයි මාසයේ දී අපනයන පරිමා දර්ශකය සියයට 46.8කින් පහත වැටුණු අතර මිල දර්ශකය සියයට 14.8කින් ඉහළ ගියේය. මෙමගින් 2019 වසරේ මැයි මාසයට සාපේක්ෂව 2020 වසරේ මැයි මාසයේදී අපනයන පහත වැටීම සඳහා අපනයන පරිමාව පහත වැටීම මුළුමනින්ම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**:  ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: අපනයන පරිමා දර්ශකය**




**මූලය**:  ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2019 මැයි (එ.ජ. ඩොලර් මිලියන) | 2020 මැයි (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2019 ජන.- මැයි (එ.ජ. ඩොලර් මිලියන) | 2020 ජන.- මැයි (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **741.3** | **401.0** | **-45.9** | **3,853.2** | **2,695.8** | **-30.0** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 37.2 | 29.3 | -21.3 | 202.3 | 156.1 | -22.8 |
| සත්ත්ව ආහාර | 11.0 | 8.2 | -25.3 | 51.4 | 37.9 | -26.1 |
| රෙදිපිළි හා ඇඟලුම් | 424.2 | 220.1 | -48.1 | 2,256.0 | 1,540.2 | -31.7 |
| එයින් ඇඟලුම් | 391.6 | 189.1 | -51.7 | 2,098.5 | 1,411.2 | -32.8 |
| රෙදිපිළි | 23.3 | 15.0 | -35.5 | 114.6 | 85.1 | -25.8 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 9.4 | 16.0 | 69.9 | 42.9 | 44.0 | 2.5 |
| රබර් නිෂ්පාදිත | 77.2 | 49.4 | -36.1 | 363.1 | 269.7 | -25.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.8 | 6.8 | -72.4 | 131.1 | 61.6 | -53.0 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 38.1 | 20.8 | -45.3 | 172.2 | 116.3 | -32.5 |
| ප්‍රවාහන උපකරණ | 7.0 | 4.1 | -41.9 | 39.7 | 23.2 | -41.5 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 39.5 | 10.6 | -73.1 | 206.4 | 202.8 | -1.8 |
| රසායනික නිෂ්පාදිත | 15.3 | 13.9 | -9.4 | 72.4 | 59.3 | -18.1 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.0 | 7.1 | -35.5 | 59.9 | 36.4 | -39.3 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.9 | 1.4 | -26.2 | 21.4 | 13.1 | -38.6 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.4 | 2.6 | -68.8 | 49.2 | 20.2 | -58.8 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.8 | 3.5 | -39.8 | 30.3 | 19.8 | -34.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 17.5 | 8.1 | -53.8 | 76.9 | 45.8 | -40.4 |
| පිඟන්මැටි නිෂ්පාදිත | 2.1 | 1.2 | -41.7 | 11.3 | 7.6 | -32.1 |
| වෙනත් කාර්මික අපනයන | 20.2 | 13.8 | -31.7 | 109.7 | 85.6 | -21.9 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **215.9** | **183.0** | **-15.2** | **1,040.6** | **809.8** | **-22.2** |
| තේ | 125.6 | 108.3 | -13.8 | 571.8 | 456.7 | -20.1 |
| රබර් | 2.4 | 1.8 | -24.0 | 13.3 | 10.6 | -20.3 |
| පොල් | 32.2 | 27.9 | -13.6 | 143.9 | 112.6 | -21.8 |
| කුළුබඩු | 22.6 | 19.3 | -14.9 | 119.1 | 82.4 | -30.8 |
| එළවළු | 2.8 | 1.9 | -33.7 | 13.6 | 9.9 | -27.2 |
| සකස් නොකළ දුම්කොළ | 2.6 | 2.2 | -15.1 | 13.0 | 8.2 | -37.0 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 9.1 | 10.2 | 11.9 | 43.7 | 54.7 | 25.1 |
| මුහුදු ආහාර | 18.6 | 11.5 | -38.0 | 122.2 | 74.8 | -38.8 |
| **3. ඛනිජමය අපනයන** | **2.6** | **2.2** | **-12.2** | **13.9** | **8.1** | **-41.7** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.3** | **0.5** | **-63.7** | **7.6** | **4.9** | **-35.4** |
| **මුළු අපනයන** | **961.0** | **586.7** | **-39.0** | **4,915.3** | **3,518.7** | **-28.4** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- 2010 වසරේ මාර්තු මාසයට පසුව ප්‍රථම වරට එ.ජ.ඩොලර් බිලියනයකට වඩා පහළ මාසික වියදමක් වාර්තා කරමින් 2020 වසරේ මැයි මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 994ක් දක්වා පෙර වසරේ මැයි මාසයට සාපේක්ෂව සියයට 44.3කින් කැපී පෙනෙන ලෙස පහත වැටුණි. 2020 වසරේ මැයි මාසයේදී පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන සියලුම ප්‍රධාන අංශවල ආනයන වියදම පහත වැටුණි. තෝරාගත් භාණ්ඩ ආනයනය අත්හිටුවීම ඇතුළු වසංගත තත්ත්වය මගින් ඇති වූ අහිතකර බලපෑම් මගින් විනිමය අනුපාතිකය සහ ජාත්‍යන්තර සංචිත මත වූ පීඩනය අඩුකිරීම අරමුණු කරගනිමින් රජය සහ මහ බැංකුව 2020 වසරේ මාර්තු මාසයේ සිට ගනු ලැබූ ක්‍රියාමාර්ග ආනයන වියදමෙහි මෙම පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.
- ඉන්ධන ආනයන වියදම පහත වැටීම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදම විශාල වශයෙන් අඩුවූ අතර, ආයෝජන සහ පාරිභෝගික භාණ්ඩ ආනයනය ද පහත වැටුණි. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි බොරතෙල් මිල ගණන් පහත වැටීම හේතුවෙන් බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන මිල ගණන් පහත වැටීම සහ ඉන්ධන සඳහා දේශීය ඉල්ලුම පහත වැටීම නිසා ආනයන පරිමා අඩුවීම ඉන්ධන ආනයන වියදම අඩුවීම සඳහා හේතු විය. බොරතෙල් බැරලයක් සඳහා සාමාන්‍ය ආනයන මිල පෙර වසරේ අනුරූප මාසයේදී වාර්තා වූ එ.ජ.ඩොලර් 74.76 ට සාපේක්ෂව 2020 වසරේ මැයි මාසයේදී එ.ජ.ඩොලර් 25.44ක් විය. ගෝලීය සැපයුම් දාමයන්ට සිදු වූ බාධා මෙන් ම, ඉදිරි කාලය සඳහා ඇඟලුම් අපනයන සඳහා ඉල්ලුම අඩු වේ යැයි වූ අපේක්ෂාවන් හමුවේ 2020 වසරේ මැයි මාසයේදී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණි. ප්‍රධාන වශයෙන් 2020 වසරේ මාර්තු මාසයේදී රජය සහ මහ බැංකුව විසින් ආනයන සීමා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ගෝලීය සැපයුම් දාමයන්ට සිදුවූ බාධා හේතුවෙන් මූල ලෝහ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත වැනි අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයන, ආයෝජන භාණ්ඩවල සියලුම උප කාණ්ඩ, සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. එළවළු (ප්‍රධාන වශයෙන් පරිප්පු සහ රතු ළූණු), කුළුබඩු (ප්‍රධාන වශයෙන් මිරිස්) සහ කිරි නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් කිරිපිටි) වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ආනයනය වියදම ඉහළ යෑම අභිබවා මුහුදු ආහාර, සීනි, පාන වර්ග සහ පලතුරු ආනයන වියදම අඩුවීම හේතුවෙන් අඩු වේගයකින් නමුත් ආහාර හා පාන වර්ග ආනයන වියදම ද අඩු විය.
- 2020 වසරේ මැයි මාසයේදී ආනයන පරිමා දර්ශකය සහ ආනයන මිල දර්ශකය යන දර්ශක දෙක ම පිළිවෙලින් සියයට 41.6කින් සහ සියයට 4.8කින් පහත වැටුණි. 2019 වසරේ මැයි මාසයට සාපේක්ෂව 2020 වසරේ මැයි මාසයේදී ආනයනය පහත වැටීම සඳහා අඩු පරිමා සහ මිල ගණන් යන දෙඅංශයෙම හේතු වූ බව මෙමගින් පිළිබිඹු වේ.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | මැයි 2019 (එ.ජ.ඩො. මිලියන) | මැයි 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | ජන.-මැයි 2019 (එ.ජ.ඩො. මිලියන) | ජන.-මැයි 2020 (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **332.5** | **264.4** | **(20.5)** | **1,552.9** | **1,533.0** | **(1.3)** |
| ආහාර හා පාන වර්ග | 134.8 | 122.1 | (9.4) | 592.3 | 685.4 | 15.7 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.4 | 1.8 | (22.6) | 14.2 | 15.7 | 10.7 |
| කිරි ආශ්‍රිත නිෂ්පාදිත | 30.3 | 36.0 | 18.7 | 134.2 | 160.1 | 19.3 |
| එළවළු | 25.5 | 30.3 | 18.8 | 118.1 | 175.9 | 49.0 |
| මුහුදු ආහාර | 25.9 | 19.5 | (24.5) | 92.2 | 84.9 | (7.9) |
| සීනි හා රසකැවිලි | 21.0 | 15.1 | (27.9) | 85.1 | 103.5 | 21.6 |
| කුළුබඩු | 7.6 | 9.6 | 25.7 | 44.1 | 59.8 | 35.5 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 22.2 | 9.8 | (55.9) | 104.4 | 85.6 | (18.1) |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 197.7 | 142.3 | (28.0) | 960.7 | 847.6 | (11.8) |
| පෞද්ගලික රථවාහන | 58.7 | 47.5 | (19.1) | 276.0 | 264.2 | (4.3) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 49.2 | 49.0 | (0.4) | 210.8 | 213.8 | 1.4 |
| ගෘහ උපකරණ | 13.6 | 10.2 | (25.2) | 85.3 | 76.7 | (10.1) |
| රෙදිපිළි හා උපාංග | 20.9 | 8.1 | (60.9) | 115.8 | 93.5 | (19.3) |
| විදුලි සංදේශ උපකරණ | 16.7 | 9.0 | (46.2) | 100.9 | 72.0 | (28.6) |
| ගෘහ හා දැව භාණ්ඩ | 14.4 | 8.9 | (38.1) | 63.1 | 57.2 | (9.3) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 24.2 | 9.6 | (60.5) | 108.7 | 70.2 | (35.4) |
| **2. අන්තර් භාණ්ඩ** | **1,047.0** | **486.3** | **(53.6)** | **4,703.8** | **3,602.0** | **(23.4)** |
| ඉන්ධන | 402.8 | 62.9 | (84.4) | 1,716.4 | 1,133.0 | (34.0) |
| එයින් බොරතෙල් | 105.6 | 15.4 | (85.4) | 398.8 | 224.6 | (43.7) |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 294.1 | 47.5 | (83.9) | 1,192.5 | 782.0 | (34.4) |
| ගල්අඟුරු | 3.1 | 0.0 | (99.9) | 125.2 | 126.3 | 0.9 |
| දියමන්ති හා අගනා ගල් වර්ග | 16.6 | 5.1 | (69.3) | 81.2 | 32.3 | (60.3) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 260.6 | 121.0 | (53.6) | 1,168.2 | 889.9 | (23.8) |
| කඩදාසි හා ඝන කඩදාසි | 43.1 | 29.2 | (32.4) | 179.7 | 149.2 | (17.0) |
| කෘෂිකාර්මික යෙදවුම් | 18.8 | 16.7 | (11.3) | 80.6 | 86.0 | 6.7 |
| තිරිඟු හා ඉරිඟු | 23.9 | 39.8 | 66.8 | 110.7 | 128.7 | 16.3 |
| මූල ලෝහ | 44.0 | 20.8 | (52.6) | 216.7 | 157.7 | (27.2) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 53.7 | 31.5 | (41.4) | 244.4 | 199.4 | (18.4) |
| රසායනික නිෂ්පාදිත | 76.3 | 60.5 | (20.7) | 350.1 | 316.0 | (9.8) |
| පොහොර | 10.6 | 29.8 | 180.3 | 85.2 | 84.8 | (0.5) |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 23.6 | 15.9 | (32.6) | 92.5 | 96.5 | 4.3 |
| ඛනිජ නිෂ්පාදිත | 13.2 | 7.7 | (41.8) | 98.7 | 60.1 | (39.1) |
| වෙනත් අන්තර් භාණ්ඩ | 59.7 | 45.4 | (24.0) | 279.4 | 268.5 | (3.9) |
| **3. ආයෝජන භාණ්ඩ** | **403.7** | **240.9** | **(40.3)** | **1,936.6** | **1,474.3** | **(23.9)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 206.8 | 158.1 | (23.6) | 1,055.6 | 843.6 | (20.1) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 149.8 | 57.8 | (61.4) | 626.8 | 417.2 | (33.4) |
| ප්‍රවාහන උපකරණ | 46.4 | 24.8 | (46.5) | 251.3 | 212.3 | (15.5) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.7 | 0.1 | (80.0) | 2.9 | 1.2 | (59.3) |
| **4. වර්ග නොකළ ආනයන** | **0.4** | **2.2** | **443.4** | **2.8** | **9.9** | **247.4** |
| **මුළු ආනයන** | **1,783.7** | **993.8** | **(44.3)** | **8,196.2** | **6,619.1** | **(19.2)** |
| **ඉන්ධන නොවන ආනයන** | **1,380.9** | **930.9** | **(32.6)** | **6,479.7** | **5,486.2** | **(15.3)** |

(අ) තාවකාලික

**මූලයන් :** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- කොවිඩ්-19 වසංගතය පැතිරයෑමත් සමඟ 2020 මාර්තු මස මැද භාගයේ සිට ශ්‍රී ලංකාව වෙත වූ සියලුම මගී ගුවන් ගමන් සහ නැව් ගමන් අත්හිටුවීමත් සමඟ 2020 මැයි මාසයේ දී **සංචාරකයින්ගේ පැමිණීම්** කිසිවක් වාර්තා නොවූ අතර, 2019 වසරේ පළමු මාස පහ තුළ දී පැමිණි 945,377ක සංචාරකයින් ප්‍රමාණය හා සැසඳීමේ දී 2020 පළමු මාස පහ තුළ සමුච්චිත සංචාරක පැමිණීම් ප්‍රමාණය 507,311ක් ලෙස වාර්තා විය.
- ඒ අනුව, සංචාරක පැමිණීම් මත පදනම්ව ඇස්තමේන්තු ගත කෙරෙන **සංචාරක ඉපැයීම්** 2020 වසරේ පළමු මාස පහ තුළ දී එ.ජ. ඩොලර් මිලියන 956ක් වූ අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 46.3ක අඩු වීමකි.
- මේ අතර, පෙර වසරේ මැයි මාසය සමඟ සැසඳීමේ දී 2020 මැයි මාසයේ දී **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** එ.ජ. ඩොලර් මිලියන 432ක් දක්වා සියයට 23.2කින් අඩු විය. සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු මාස පහ හා සැසඳීමේ දී 2020 වසරේ පළමු මාස පහ තුළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 2,407ක් දක්වා සියයට 11.9කින් අඩු විය.

**රූප සටහන 8: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූලය ලැබීම්

- 2020 වසරේ මැයි මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද **රාජ්‍ය සුරැකුම්පත්** වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 3ක ශුද්ධ විදේශීය ආයෝජන ගෙවීම් වාර්තා වීමත් සමඟ, සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස පහ තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 454ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2020 වසරේ මැයි මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් මිලියන 126ක් ලෙස සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතුණි.
- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් වසා දැමුණු **කොළඹ කොටස් වෙළඳපොළ**, 2020 වසරේ මැයි 11 වන දින සිට වෙළඳාම සඳහා නැවත ආරම්භ කිරීමෙන් පසුව 2020 මැයි මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි ද්විතීයික වෙළඳපොළ තුළින් එ.ජ. ඩොලර් මිලියන 36ක ශුද්ධ ගෙවීම් වාර්තා විය (2020 මැයි මාසයේ දී ප්‍රාථමික වෙළඳපොළ ලැබීම් වාර්තා නොවීය). සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස පහ තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ එ.ජ. ඩොලර් මිලියන 64ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.
- තව ද, ප්‍රධාන වශයෙන් ඒකාබද්ධ ණය පහසුකම හා සම්බන්ධව එ.ජ. ඩොලර් මිලියන 333ක ආපසු ගෙවීම හේතුවෙන් 2020 වසරේ මැයි මාසයේ දී රජය වෙත වූ **දිගු කාලීන ණය** මත එ.ජ. ඩොලර් මිලියන 313ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

- 2020 වසරේ මැයි මස අවසානය වන විට **දළ නිල සංචිත** ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 6.5ක් වූ අතර, එය ආනයනික මාස 4.2කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 වසරේ මැයි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 9.2ක් වූ අතර, එය ආනයනික මාස 6.0කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2020 වසරේ මැයි මාසයේදී ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. මෙම තත්ත්වය හමුවේ, 2020 අප්‍රේල් මස 09 වැනි දින වන විට එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 9.1කින් අවප්‍රමාණය වූ රුපියල, එතැන් සිට අතිප්‍රමාණය වූ අතර, 2020 වසරේ ජූලි මස 13 වැනි දින තෙක් වූ කාලය තුළ දී සියයට 2.3ක සමස්ත අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් වසරේ ජූලි මස 13 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල, යූරෝ, ජපන් යෙන් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුම සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 | 2020 (ජූලි 13 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% | -2.3% |
| යූරෝ | -12.7% | +2.6% | -3.2% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -2.8% | +1.4% |
| ජපන් යෙන් | -18.1% | -1.0% | -3.9% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +1.3% | -1.8% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% | +3.0% |

**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව